*ප්‍රවේශය*.- පූගොඩ නගර මධ්‍යයේ සිට කිරිඳිවෙල පාරේ පට්ටියගම පාර දක්වා කි. මී. 1.5 ක් පමණ ගමන් කරන්න. එතැනින් දකුණට හැරී එම පාරේ මීටර් 500 ක් පමණ ඉද්දමල්ගම ග්‍රාමය දක්වා යන්න. එතැනින් දකුණට හැරී මීටර් 20 ක පමණ පළමු පටුමග දක්වා ඉදිරියට යන්න. එතැනින් වමට ඇති ගුරුපාරේ මීටර් 50 ක් පමණ ගියවිට එම පාරේ වම් අත පැත්තේ ඇති අදාල දේපලට ළඟාවිය හැකිය.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.06.11 වැනි දින ඩේලි මිරර් සහ ලංකාදීප පුවත් පත් ද 2010.06.18 දිනැති තිනක්කුරල් පුවත්පත ද 2010.06.24 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් සියයට එකක් (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03. (දුරකථන අංකය : 011-2456285, 2456284).

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 011-345975.

07-91

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙහිවල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එස්. හල්පේ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද, 2008.08.20 දිනැති සහ අංක 1330 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම, රවීන්ද්‍ර පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ ජූලි මස 18 වැනි දින ප.ව. 3.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාවෙහි නැදිමාල ගමේ, ක්වොරි පාරේ වරිපනම් අංක 212/2බී නමැති ඉඩමට බලයලත් මානක අයි. ඩබ්. ඩබ්. ඉන්ද්‍රතිස්ස විසින් 1969.07.12 දින මැන සාදන ලද අංක 2730 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3ඒ ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 7.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.03.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* හා 2011.03.08 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* දෙහිවල මංසන්ධියේ සිට මහරගම පාර නමින්ද හැඳින්වෙන හිල් වීදියේ කි. මී. 1.1 ක දුරක් ගමන් කර (NOLIMIT සාප්පුව පසුකර) ගල්විහාර පාර නමින්ද හැඳින්වෙන ක්වොරි (ගල්වල) පාරට වමට හැරී වරිපනම් අංක 212 දරන පරිශ්‍රය දක්වා මීටර් 500 ක් පමණ ගොස් එතැනින් වමට හැරී එම අතුරු පාරේ මීටර් 100 ක් පමණ ගියතැන ක්වොරි (ගල්වල) පාරේ වරිපනම් අංක 212/2බී දරන අදාල දේපල දකුණු අත පැත්තේ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. (දුරකථන අංක 2661826, 2661835) ගෙන් ලබා ගතහැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය : 0112-345975.

07-90

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී- මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් 1995 දෙසැම්බර් මස 24 වැනි දින සාදන ලද අංක 3345 බී දරන පිඹුර පරිදි, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ කටුබැද්ද ග්‍රාමයේ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 34/1 හි පිහිටි මහඹිවිට හෙවත් දවටගහඹිවිට කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 2ඒ දරන (1 වන උපලේඛනය) ඉඩමේ ප්‍රමාණය පර්චස් විසිඑකයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 21.30) විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගසකොළ වගාවන් ගොඩනැගිලි ආදී සියළු දේ සමග සහ මාර්ග අයිතියද සමග වේ.

බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1989 මැයි මස 12 වැනි දින (වඩාත් නිවැරදිව 1987 දී සාදන ලද අංක 2418 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ දැන් කුඩුවාමුල්ල ලෙස හඳුන්වන ගාලු පාරේ රාවතාවත්ත, මොරටුව, කටුබැද්ද ගාලු පාරේ පිහිටි වර්තමානයේ සඳහන් වන වරිපනම් අංක 371 (පෙර 524බී) හි පිහිටි මොරටුව වලව්වත්ත ලෙසත් හඳුවන්වනු "වලව්වත්ත" කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් බී 2 දරන (2 වන උපලේඛනය) ඉඩමේ ප්‍රමාණය පර්චස් හතරයි දශම හතයි අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.785) විශාල ඉඩම සහ ඒ මත පිහිටි ගසකොළ වගාවන් ගොඩනැගිලි ආදී සියළු දේ සමග සහ මාර්ග අයිතියද සමග වේ.

සිනෙකා ට්‍රේඩ් සෙන්ටර් ඇන්ඩ් ටේලර්ස් යන ව්‍යවහාර ව්‍යාපාර නාමයෙන් හවුල් ව්‍යාපාර ආයතනයක් පවත්වාගෙන යන ගලමුල හේවගේ නන්දසේන සහ හේවාලියනගේ කුමාරි රථිකා ණයකරුවන් හැටියට ද ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කරන ලද ඉහත 1 වැනි සහ 2 වැනි උපලේඛනයේ සඳහන් දේපල -

1 වැනි උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2011 ක් වූ ජූලි මස 26 වැනි දින පෙ.ව. 10.00 ට සහ 2 වැනි උපලේඛනයේ සඳහන් දේපල වර්ෂ 2011 ක් වූ ජූලි මස 26 වැනි දින පෙ.ව. 11.00 ට ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.06.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.05.24 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2011.07.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද සහ 2011.07.04 වැනි දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම* :-

1 වැනි *උපලේඛනය*

කටුබැද්ද හංදියේ සිට ටික දුරක් ගියවිට බණ්ඩාරනායක මාවත හෙවත් කැම්පස් පාර හමුවේ. එම පාරේ මීටර් කිහිපයක් ගියවිට අදාල දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇති අතර ඉඩමට පිවිසීම සඳහා අඩි 10 ක් පළල පාරක් ඇත.

2 වැනි *උපලේඛනය*

කටුබැද්ද හංදියේ සිට මොරටුව දෙසට ටික දුරක් ගියවිට අදාල දේපළ වරිපනම් අංක 371 ගාලු පාරේ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොරටුව ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු.

අංක 99, උසාවි පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,

අංක 106, පරණ ගාලු පාර,
මොරටුව,
දුරකථන අංකය : 2643084/6
ෆැක්ස් අංකය : 5555523

07-112

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2006.08.04 දිනැති හා අංක 2294 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, දොඩම් පහලගේ අනෝජන් ප්‍රියලාල් ප්‍රනාන්දු යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපල වර්ෂ 2011 ක් වූ ජූලි මස 25 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව නගර සභා සීමාවේ කටුබැද්දේ පොල්කොටුව පාරේ වරිපනම් අංක 79 හි කදුරුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මානක එච්. ඩබ්ලිව්. ඒ ද සිල්වා විසින් මැන සාදන ලද 2003.06.14 වැනි දින අංක 1932 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද කැබලි අංක 2 දරන ඉඩම.

පිඹුරු අංක 1932 හි ලොට් 4 ලෙස නිරූපිත (අඩි 10 ක් පළල පාර) පර්චස් තුනයි දශම බින්දුවයි හතර (අ. 0, රූ. 0, පර්. 3.04) ක මාර්ග අයිතිය ද සමග වේ.

*ප්‍රමාණය* : පර්චස් එකොළහයි දශම නමයයි හතර (අ. 0, රූ. 0, පර්. 11.94)

*දේපළට පිවිසීම*.-කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රාවතාවත්ත දක්වා ගමන් කොට ආරක්ෂක මුරපොල පසුකොට කටුබැද්ද හන්දියෙන් රාවතාවත්ත පාරට පිවිස (සෙලාන් බැංකුව ඉදිරිපිට) යාර කිහිපයක් ගමන් කිරීමේ දී හමුවන පොල්කොටුව පාරේ (පන්සලට යාමට ඇති පාරේ) යාර කිහිපයක් ඉදිරියට ගමන් කිරීමේ දී වම් පැත්තට වන්නට මෙම දේපල පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2010.07.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2010.07.08 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැනුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් 2 1/2%ක්, (සියයට දෙකහමාරක්),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ නොවුනහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661835, 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංකය : 071-4175944
075-8489378

07-129

---

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කඩුවෙල දිසා අධිකරණයේ දී ය

සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්,
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන්ද හැඳින්වේ
අංක 340/1/2 ආර් ඒ ද මැල් මාවත කොළඹ 03.

නව ලිපිනය : අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06

නඩු අංකය : 213/එම්
ස්වභාවය : උකස් නිශ්චල
පටිපාටිය : සාමාන්‍ය

.................................පැමිණිලිකරු.

-එදිරිව-

රණවීරගේ සුමුදු නියෝමල් රණවීර අංක 255, පරාක්‍රම පාර, මත්තුමගල, රාගම,

.................................විත්තිකරු.

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරි බලපත්‍රය මත මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල, වර්ෂ 2011 ක් වූ ජූලි මස 26 වැනි දින ප.ව. 1.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගල්උඩුපිල පිහිටි දෙල්ගහවත්ත නැමති ඉඩමට කේ. ඊ. ජේ. පී. පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 8606 සහ වර්ෂ 2006 ක් වූ මාර්තු මස 01 වැනි දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 3ඩී සඳහා මායිම්, උතුරට : ඉහත ඉඩමේ කැබලි අංක 4 මාර්ගය, ඩී. ඩී. පැට්‍රික් සිබට්ගේ ඉහත ඉඩමෙහි කැබලි 2 නැගෙනහිරට : ඩබ්ලිව්. පී. බෝපේආරච්චි, ශිරානි බෝපේආරච්චි, සරෝජිනී බෝපේආරච්චි ගේ ඉහත ඉඩමෙහි කැබලි 6, දකුණට : ඉහත ඉඩමෙහි කැබලි 3, බස්නාහිරට : මාර්ගය (අඩි 10 පළල) යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස්පහයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 35.65) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ ගොඩනැගිලි සහ සෑම සියලු දේත් සහ අංක 519 පිඹුර ප්‍රකාර කැබලි අංක 4 හි නිරූපිත මාර්ග අයිතිය සහ අංක 4687 පිඹුරෙහි කැබලි අංක එෆ් (f) හි නිරූපිත මාර්ග අයිතිය සමග වේ. මෙම දේපල ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 503/166 දරන වෙළුමේ සහ පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

*පිවිසීම.*-කොළඹ-මීගමුව ප්‍රධාන පාරේ මහබාගේ නගරය දක්වා ගමන් කිරීමේ දී දකුණු පැත්තට (මැක්ඩොනල්ඩ්ස් අසළ) ඇති පරාක්‍රම පාරේ මීටර් 30 පමණ ගමන් කිරීමේ දී දකුණු පැත්තේ පිහිටා ඇති ශාන්ති ස්ටෝර්ස් අසලින් දකුණු පැත්තට වැටී ඇති අඩි 10ක් පමණ පළල පාරේ මීටර් 10ක් පමණ ගමන් කිරීමේ දී වම් පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනාවත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. ප්‍රාදේශීය සභා ගාස්තු සඳහා 1% (සියයට එකයි),
3. ගැනුම් මිලෙන් පළමුවන රු. 7500 ට රු. 160 ක් ද ඊට අමතරව ලැබෙන සෑම රුපියල් 1000 කට රු. 5 බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද (කණු ගාස්තු),
4. සියලුම ප්‍රසිද්ධ කිරීමේ සහ ප්‍රචාරක වියදම්,
5. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් 2 1/2%ක්,
6. මුද්දර ගාස්තු රු. 250,
7. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම රු. 3000,
8. නොතාරිස් ගාස්තු රු. 3000,
9. ලිපිකරු හා සෝෂක ගාස්තු රු. 2500,
10. අමතර වියදම් රු. 3000.

ඉතිරි 75% ක මුදල දින 30 ක් ඇතුළත කඩුවෙල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය. එම මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති සියලු මුදල් ආපසු නොගෙවන අතර, එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට කටයුතු කරනු ලැබේ. අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා කළමණාකරු (ණය අයකිරීම්) - සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් සීමාසහිත සණස සංවර්ධන බැංකුව බත්තරමුල්ල ශාඛාවෙන් සහ දුරකථන අංක 2866994- 071-8673931 ගෙන් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 61/1 ප්‍රගති මාවත,
බංගලාවත්ත - කොට්ටාව,
දුරකථන අංක : 071-4175944
075-8489378.

07-128

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල කළුතර පදිංචි බදුගමගේ ඉඳුනිල් කාලිංග කුමාර යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණයපහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

### 1 වැනි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර බැද්ද දේසස්ත්‍ර කළුතර පිහිටි බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ විසින් සාදන ලද 2002.08.19 වැනි දින අංක 880 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ඒ ලකුණු කළ ඉලක්කපිටියවත්ත නමැති බිම, ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග (බලයලත් මිනින්දෝරු එච්. විජේසුන්දර විසින් සාදන ලද 1967.06.29 සහ 1997.07.06 දිනැති අංක 1520 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 හා සමාන කළුතර දි. අ. නඩු අංක පී 3428 නඩුවේ ගොනු කර ඇති බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සාදන ලද 1987.06.06 දිනැති අංක 127 දරන සැලැස්මේ නැවත මනින ලද ඉඩම වන) ඉඩම් කොටස පෙර කී අංක 880 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් පහළොවයි දශම දෙකක් (අ. 0, රූ. 1, පර්. 15.2) විශාල ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය පී 238/176 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2011 ජුලි මස 22 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කළුතර ඔරලෝසු කණුව මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ පානදුර දෙසට කි. මී. 1.3 ක් පමණ ගිය විට වරිපනම් අංක 260 දරන අදාල දේපල මාර්ගයේ වම්පස පිහිටා ඇත. (දඹුළු ලී බඩු ගොඩනැගිල්ල ඉදිරිපිට).

### 2 වැනි වෙන්දේසියේ විකිණීම

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර බැද්ද, කළුතර තොටමුණ උතුර පලාතොට පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සෙනවිරත්න විසින් සාදන ලද 1993.12.08 වැනි දිනැති අංක 7294 දරන සැලැස්ම අනුව, ගොඩපරගහ වත්ත එස්ටේට් නමැති බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩමේ ලොට් 1බී ලකුණු කළ (පෙර කී දිනැති අංක 7294 දරන සැලැස්මේ සඳහන් ලොට් 38 හි අතුරු බෙදීමක් වන) සම්පූර්ණ ඉඩම් කොටස පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම. මෙය කළුතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය පී 177/268 හි ලියාපදිංචි කර ඇත.

2. පෙර කී පලාතොට පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සෙනෙවිරත්න විසින් සාදන ලද 1993.12.08 වැනි දිනැති අංක 7294 දරන සැලැස්ම අනුව ගොඩපරගහ වත්ත එස්ටේට් නමැති බිම, ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 සී ලකුණු කළ (පෙර කී දිනැති අංක 7294 දරන සැලැස්මේ සඳහන් ලොට් 38 හි අතුරු බෙදීමක් වන) සම්පූර්ණ ඉඩම් කොටස පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය පී 177/269 හි ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර බැද්ද, කළුතර තොටමුණ උතුරු පලාතොට පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සෙනෙවිරත්න විසින් සාදන ලද 1993.12.08 වැනි දිනැති අංක 7294 දරන සැලැස්ම අනුව ගොඩපරගහ වත්ත එස්ටේට් නමැති බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඩී සහ වඩාත් නිවැරදිව ලොට් 1 ඩී ලකුණු කළ (පෙර කී දිනැති අංක 7294 දරන සැලැස්මේ සඳහන් ලොට් 38 හි අතුරු බෙදීමක් වන) සම්පූර්ණ ඉඩම් කොටස පර්චස් තිස්තුනක් (අ. 0, රූ. 0, පර්. 33) විශාල ඉඩම. මෙය කළුතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය පී 185/181 හි ලියාපදිංචි කර ඇත.

පෙර කී ඉඩම් එකතු කර නැවත මැන ඇති අතර පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර කර ඇත.

පෙර කී පලාතොට පිහිටි බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ විසින් සාදන ලද 2000.10.16 දිනැති අංක 454 දරන සැලැස්ම අනුව ගොඩපරගහ වත්ත එස්ටේට් නමැති බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ (පෙර කී 1993.12.08 දිනැති අංක 7294 දරන සැලැස්මේ සඳහන් ලොට් 1බී, 1 සී, සහ 1ඩී හි එකතු කිරීමක් වන) ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් විසිතුනක් (අ. 0, රූ. 1, පර්. 23) නොහොත් හෙක්ටයාර් 0.15934 ක් විශාල ඉඩම. මෙය කළුතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රය පී 228/112 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2011 ජුලි මස 22 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කළුතර ඔරලෝසු කණුව මංසන්ධියේ සිට පලාතොට පාර ඔස්සේ ගොස් දකුණු පසට ඇති පොලිස් අභ්‍යාස විද්‍යාල පිහිටා ඇති මාර්ගයේ ඉදිරියට ගිය විට ඇති 3 වන කි. මී. කණුවට මීටර් 100ක පමණ පෙර දකුණු පසට ඇති අල්විස් වත්ත පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 350 ක් පමණ ඉදිරියට ගිය විට වම්පසට පිහිටා ඇති මාර්ගයට හැරී තවත් මීටර් 150 ක් පමණ ගිය විට අදාල දේපලට පිවිසෙන මාර්ගය වම්පස පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- *රජයේ ගැසට් පත්‍රයේ* 2011.03.25 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2011.03.07 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2011.03.17 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය. හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකරී (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලුපාර, කොළඹ 03. දුරකථන අංක 011-2456285, 2456276, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 011-2572940.

07-76

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| ජූලි | 2011.07.01 | සිකුරාදා | 2011.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.08 | සිකුරාදා | 2011.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.15 | සිකුරාදා | 2011.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.22 | සිකුරාදා | 2011.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.29 | සිකුරාදා | 2011.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2011.08.05 | සිකුරාදා | 2011.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.12 | සිකුරාදා | 2011.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.19 | සිකුරාදා | 2011.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.26 | සිකුරාදා | 2011.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2011.09.02 | සිකුරාදා | 2011.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.09 | සිකුරාදා | 2011.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.16 | සිකුරාදා | 2011.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.23 | සිකුරාදා | 2011.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.09.30 | සිකුරාදා | 2011.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.